# මැතිවරණ කොමිෂන් සභාව
# தேர்தல்கள் ஆணைக்குழு

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல : 011-2868426

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய (10107)

***web : www.elections.gov.lk*** ***e-mail : info@elections.gov.lk***

| | | |
|---|---|---|
| මගේ අංකය : **PRE/2019/09**<br>எனது இல. | ඔබේ අංකය :<br>உமது இல. | දිනය : 2019.09.19<br>திகதி |

*ඉතා හදිසි/ ඉතා වැදගත්*

**සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්/ පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් /**
**පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරු/ආණ්ඩුකාරවර ලේකම්වරු/ දෙපාර්තමේන්තු ප්‍රධානීන් /**
**කොමිෂන් සභා ලේකම්වරු/ රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත,**

### *ජනාධිපතිවරණය - 2019.11.16*
### *තැපෑලෙන් ඡන්දය දීම*

**ඉදිරියේ දී පැවැත්වීමට නියමිත ජනාධිපතිවරණය සඳහා 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ, 23 වගන්තියේ විධිවිධානවලට අනුව තැපෑලෙන් ඡන්දය දීම සඳහා වූ පහසුකම් ඉල්ලීමට හිමිකම් ඇති ඡන්ද හිමියන් වෙත එනම්, ඡන්ද විමසීමට අදාළ රාජකාරිවල නිරත වීම හෝ අනිවාර්යයෙන් පවත්වාගෙන යා යුතු වෙනත් අත්‍යාවශ්‍ය සේවාවල නිරතවීම හේතුවෙන් තමාට වෙන් කරන ලද ඡන්ද පොළට පෞද්ගලිකව ගොස් ඡන්දය දීමට නොහැකි වීමට ඉඩ ඇති ඡන්ද හිමියන් සඳහා තැපෑලෙන් ඡන්දය දීම සඳහා පහසුකම් සැලසිය යුතු වේ.**

**02.** **ඒ සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන් වෙත නිකුත් කොට ඇති උපදෙස් මාලාවක් මේ සමඟ එවා ඇත. ඔබ ආයතනයේ තැපැල් ඡන්ද ඉල්ලුම්පත් සම්බන්ධව කටයුතු සම්බන්ධීකරණය සඳහා නිලධාරියකු නම් කොට ඔහු මඟින් ආයතනයේ සියලුම නිලධාරීන් දැනුවත් කොට නියමිත දිනට පෙර සහතික කරන ලද තැපැල් ඡන්ද ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත යොමු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම මැනවි.** ***මැතිවරණ රාජකාරීවලින් නිදහස් කර ඇති අය හැර රජයේ සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ අනෙකුත් සියලුම නිලධාරීන් තැපැල් ඡන්ද ඉල්ලුම් කල යුතු අතර තැපැල් ඡන්ද අයදුම්කර නොතිබීම මෙන්ම අඩුපාඩු සහිතව ඉදිරිපත් කරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කර තිබීම ද මැතිවරණ රාජකාරීවලින් නිදහස් කිරීමට හේතුවක් නොවේ.***

**03.** **ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීම පිළිබඳ පනතේ විධිවිධානවලට අනුව ජනාධිපතිවරණය පැවැත්වීම සම්බන්ධයෙන් වූ මැතිවරණ කොමිෂන් සභාවේ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට දින දහයක් ඇතුළත තැපැල් ඡන්ද ඉල්ලුම්පත් අදාළ තේරීම්භාර නිලධාරීන් වෙත ලැබිය යුතු ය. ඒ අනුව ඉල්ලුම්පත් බාරගැනීම 2019 සැප්තැම්බර් 18 දින ආරම්භ වී 2019 සැප්තැම්බර් 27 දින අවසන් වීමට නියමිත වුවද තැපැල් ඡන්ද අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියේ දී තොරතුරු ලබාගැනීමේ ගැටළු, සහතික කිරීමේ දී සිදුවන ප්‍රමාදවීම් හා තැපැලේ දී සිදුවන ප්‍රමාද වීම් යනාදිය සලකා බලා** ***තැපෑලෙන් ඡන්දය දීම සඳහා ඉල්ලුම්පත් භාරගැනීම, 2019 සැප්තැම්බර් 30 දින දක්වා බාර ගැනීමට තීරණය කර ඇත. මෙම දිනය කිසිදු හේතුවක් මත දීර්ඝ කරනු නොලැබේ.***

ඒ අනුව ඔබගේ ආයතනයේ සේවයේ නියුතු සහ තැපැල් ඡන්ද ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් සපුරා ඇති සියලු දෙනාගේම අයදුම්පත් 2019 සැප්තැම්බර් 30 දින හෝ එදිනට පෙර හෝ අදාළ දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරී වෙත ලැබී තිබිය යුතු ය. අයදුම්පත්‍ර බාරගැනීම අවසන් දිනයේ දී එනම්, 2019 සැප්තැම්බර් 30 දින මධ්‍යම රාත්‍රී 12.00ට පෙර ඒවා නියමිත දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට ලැබිය යුතු අතර, එදිනට අයදුම්පත්‍ර තැපැලට බාරදීම පමණක්, එම අයදුම්පත්‍ර පිළිගැනීම සඳහා හේතුවක් නොවේ.

**04.** තැපැල් ඡන්ද දායකයන්ගේ පහසුව සඳහා මැතිවරණයට වලංගු ඡන්ද හිමි නාමලේඛන 2019 සැප්තැම්බර් 18 දින සිට පහත සඳහන් ස්ථානවල ප්‍රදර්ශනය කිරීමට කටයුතු යොදා ඇත.

* සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල (කච්චේරිවල)

* සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල } අදාළ බල ප්‍රදේශයට අයත් වන
* සියලුම ග්‍රාම නිලධාරී කාර්යාලවල } ඡන්ද ප්‍රදේශයේ නාමලේඛනය

**05.** ඉහත සඳහන් කළ ප්‍රදර්ශන ස්ථාන අතුරින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල එම දිස්ත්‍රික්කයට අදාළව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හා ග්‍රාම නිලධාරී කාර්යාලවල එම බල ප්‍රදේශයට අදාළව පොත් වශයෙන් සකස් කරන ලද ඡන්ද හිමි නාමලේඛන පිටපත් ප්‍රදර්ශනයට තබා ඇත. මෙම ඡන්ද විමසීමේ දී පූර්වයෙහි දී මෙන් රජයේ කාර්යාල සංකීර්ණවල ඡන්දහිමි නාමලේඛන පොත් වශයෙන් තබා ප්‍රදර්ශනය කිරීමක් සිදු නොවන බව අවධාරණය කරනු ලැබේ.

**06** එබැවින් සියලුම තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන්ට දිවයිනේ සියලුම දිස්ත්‍රික්කවලට අදාළ ඡන්ද හිමි නාම ලේඛන විස්තර මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හරහා තොරතුරු තාක්ෂණ සේවාවක් (e-service) භාවිතයෙන් අයදුම්කරුවන් වෙත තොරතුරු ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා ඇත. ඉහත ප්‍රදර්ශන ස්ථාන හා තමන්ගේ සේවා ස්ථානවල සහතික කිරීමේ නිලධාරීන් වෙත ගොස් අයදුම්කරු පදිංචි දිස්ත්‍රික්කය හා හැඳුනුම්පත් අංකය ඉදිරිපත් කළ පසු තැපැල් ඡන්ද ඉල්ලුම්පත් සම්පූර්ණ කිරීමට අදාළ තොරතුරු ලබා ගත හැකිය. ජාතික හැඳුනුම්පත් අංක නොමැති අයදුම්කරුවන් ඡන්ද හිමි නාමලේඛන පොත් වශයෙන් ප්‍රදර්ශනය කරනු ලබන ඉහත සඳහන් කළ ස්ථානයකින් එම තොරතුරු ලබාගත යුතු වේ.

**07.** තැපැල් ඡන්ද පහසුකම් ලබාගැනීම සඳහා සම්පූර්ණ කළ යුතු වන අයදුම්පත් සියලුම ඡන්දහිමි නාමලේඛන ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානවලින් , දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් ලබාගත හැකි අතර , මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියවන elections.gov.lk යෙන් ද බාගත කර ගත හැකිය.

**08.** ඉහතින් සඳහන් කළ පරිදි තැපැල් ඡන්ද දායකයින්ට ස්වකීය ලියාපදිංචියට අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා 2018 ඡන්දහිමි නාමලේඛනයේ තොරතුරු තාක්ෂණ සේවාවක් (e-service) දිවයිනේ සියලුම තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් වෙත ලබා දීමට කටයුතු සම්පාදනය කර ඇති අතර ඒ සඳහා සියලුම තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් විසින් තම කාර්යාලයට අයත් පරිපාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස් වෙත මේ සමඟ අමුණා ඇති 1 වැනි ආකෘතිය ඉදිරිපත් කිරීමෙන් තැපැල් ඡන්දදායකයන්ට අවශ්‍ය තොරතුරු සොයා ගැනීමේ ඉ-සේවා පහසුකම ලබා ගත හැකි වේ. මැතිවරණ කොමිෂන්

සභාව විසින් මෙම ඉ-සේවා පහසුකම් සලසනු ලබන්නේ තැපැල් ඡන්ද අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනය දක්වා පමණි. එබැවින් තැපැල් ඡන්ද ඉල්ලුම්පත්‍ර භාරගැනීම ආරම්භ කිරීමට පෙර නියමිත පරිදි අයදුම්පත්‍ර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ඉදිරිපත් කොට එම ඉ-සේවා පහසුකම ලබා ගන්නා ලෙස සියලුම ආයතන ප්‍රධානීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

09. කෙසේ වුවද තැපැල් ඡන්ද අයදුම්පත් සම්පූර්ණ කිරීමට අවශ්‍ය තොරතුරු සොයා ගැනීමේ ප්‍රමාදය වැළැක්වීම් වස් නිලධාරීන්ට අදාළ තොරතුරු පූර්වයෙන් සොයා ගැනීම සඳහා 2019 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනය ප්‍රතිශෝධනයට අදාළව ග්‍රාම නිලධාරීන් විසින් බෙදා හරිනු ලබන ඡන්ද හිමියන් ගණන් ගැනීමේ ආකෘතිය (BC ආකෘතිය) සමඟ ලබා දී ඇති 2018 වර්ෂයේ ලියාපදිංචියට අදාළ එම තොරතුරු පාදක කරගන්නා ලෙස දන්වා 2019.08.19 දින ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් පළ කොට ඇති අතර, එය සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත මණ්ඩල වෙත ද නිකුත් කොට ඇත. ඔබගේ පහසු පරිශීලනය පිණිස එහි පිටපතක් මේ සමඟ අමුණා ඇත.

10. තවද, ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි තැපැල් ඡන්ද අයදුම්කරුවන්ට ස්වකීය අයදුම්පත්‍ර සම්පූර්ණ කිරීමට අවශ්‍ය තොරතුරු මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන elections.gov.lk වෙත පිවිස තම හැඳුනුම්පත් අංකය හා ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි දිස්ත්‍රික්කය ඇතුළත් කිරීමෙන් ද, නොඑසේ නම් රාජ්‍ය තොරතුරු කේන්ද්‍රයේ 1919 ඇමතීම මඟින් ද ලබාදීමට අවකාශ සලසා ඇති අතර, ඒ බව ඔබ ආයතනයේ සියලුම තැපැල් ඡන්ද අයදුම්කරුවන් වෙත දැනුම් දෙන්න.

11. එක හා සමාන පුද්ගල නාම පවතින හෙයින් තමන්ගේ තොරතුරු වෙනත් අයෙකු ලවා පරීක්ෂා කොට තැපැල් ඡන්ද අයදුම්පත් සම්පූර්ණ කිරීමෙන් වළකින ලෙස තැපැල් ඡන්ද අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

12. තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් පත් කිරීම සඳහා මේ සමඟ අමුණා ඇති ආකෘතිය (ඇමුණුම II) පාවිච්චි කළ යුතු අතර අදාළ *සහතික කිරීමේ නිලධාරීන්ගේ පත්වීම් ලිපි රාජගිරිය සරණ පාරේ පිහිටි මැතිවරණ මහලේකම් කාර්යාලයට නොව, අදාළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත පමණක් වහාම යැවිය යුතු බව දන්වා සිටිමි.* මැතිවරණ මහලේකම් කාර්යාලයට යොමු කරනු ලබන මෙවැනි කිසිඳු පත්වීම් ලිපියක් නැවත දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට යොමු කිරීමට මැතිවරණ මහලේකම් කාර්යාලය කටයුතු නොකරන බව වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි. සහතික කිරීමේ නිලධාරීන් පත්කිරීමේ දී, අයදුම්කරුවන් විශාල ප්‍රමාණයක් සිටින විට සහතික කිරීමේ නිලධාරීන් කිහිප දෙනෙකු පත්කිරීම අවශ්‍ය වන අතර එහිදී පසුගිය ඡන්ද විමසීම්වල දී මෙම කටයුතුවල යෙදී අත්දැකීම් සහිත නිලධාරීන්ට ප්‍රමුඛත්වයක් ලැබෙන පරිදි ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් පත්කිරීම සුදුසු වේ. කෙසේ වෙතත් තැපැල් ඡන්ද සලකුණු කිරීම දින දෙකකට සීමා කරන බැවින් එක් නිලධාරියෙකු සඳහා උපරිම වශයෙන් තැපැල් ඡන්ද 200 – 250 ක් පමණ සහතික කිරීමට පැවරීම සුදුසුය.

**13.** තැපැල් ඡන්ද පාවිච්චි කිරීමේ දිනය තෙක් සේවයේ නොයෙදී ඉතා කෙටි කාලයක් තුළ රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමට නියමිත නිලධාරීන්, සහතික කිරීමේ නිලධාරීන් වශයෙන් පත් කිරීමෙන් දෙපාර්තමේන්තු ප්‍රධානීන් වැළකී සිටිය යුතු ය.

**14.** තැපැල් ඡන්ද සහතික කරන නිලධාරීන්ට තමන් විසින් සහතික කරන ලද අයදුම්කරුවන්ගේ ලේඛනයක් (ඇමුණුම III) පවත්වාගෙන යන ලෙස උපදෙස් ලබා දිය යුතු අතර, තැපැල් ඡන්ද ඉල්ලුම්පත් සහතික කල පසු ඒවා පිළිගත් / ප්‍රතික්ෂේප කළ බව දැන්වීම හා පිළිගත් තැපැල් ඡන්ද අයදුම්කරුවන් වෙත ඡන්ද පත්‍රිකා අඩංගු පැකැට්ටු එවීම සඳහා සහතික කිරීමේ නිලධාරීන්ගේ නම, තනතුර, කාර්යාල ලිපිනය (අනිවාර්යයෙන්ම නිල මුද්‍රාව මගින්) ඉල්ලුම් පත්‍රයෙහි සටහන් කරන ලෙසද උපදෙස් ලබා දෙන්න.

**15.** අයදුම්පත් නිවැරදිව සම්පූර්ණ කර, සහතික කිරීමේ නිලධාරි විසින් සහතික කිරීමෙන් පසුව ඒවා නියමිත දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත යැවිය යුතු ය. ඒ ඒ දිස්ත්‍රික්කවල තැපැල් ඡන්ද අයදුම්පත් ඉදිරිපත් කළ යුතු තේරීම්භාර නිලධාරී කාර්යාල ලිපින දැක්වෙන ලේඛනයක් මේ සමඟ ඇමුණුම IV ලෙස යාකර එවා ඇත.

තැපැල් ඡන්ද අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා තොරතුරු ලබා ගැනීම, ඒවා ඉදිරිපත් කිරීම හා සහතික කිරීමේ නිලධාරීන් පත්කිරීමට අදාළ කරුණු පමණක් මෙම චක්‍රලේඛයේ අඩංගු අතර තැපැල් ඡන්ද ක්‍රියාවලියට අවැසි සෙසු උපදෙස් හා කාර්ය පටිපාටි සහතික කිරීමේ නිලධාරීන් වෙනුවෙන් ඉදිරියේ දී පවත්වනු ලබන උපදෙස් ලබාදීමේ සාකච්ඡාවල දී ලබා දෙනු ඇත.

මහින්ද දේශප්‍රිය
සභාපති- මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)

පිටපත්.

01. සියලුම තේරීම් භාර නිලධාරීන්
02. සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය /සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත } දැන ගැනීම හා දිස්ත්‍රික්කයේ රාජ්‍ය ආයතන දැනුම්වත් කිරීම පිණිස.

03. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් වෙත - දැන ගැනීම පිණිස

සභාපති
தவிசாளர்

දුරකථන/தொலைபேசி : 011-2868444
ෆැක්ස්/ தொலைநகல் : 011-2868445
*e-mail : comelesl@sltnet.lk*

ලේකම්
செயலாளர்

දුරකථන/தொலைபேசி : 011-2868406
ෆැක්ස්/தொலைநகல : 011-2868406
*e-mail : admin@elections.gov.lk*

අධ්‍යක්ෂ (පර්යේෂණ හා සැලසුම්)
பணிப்பாளர் (ஆராய்ச்சி மற்றும் திட்டமிடல்)

දුරකථන/தொலைபேசி : 011-2877618
ෆැක්ස්/தொலைநகல : 011-2877618
*e-mail : ddreseplan@slelections.gov.lk*

ඇමුණුම I

**ජනාධිපතිවරණය - 2019**

**තැපැල් ඡන්ද අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා 2018 වර්ෂයේ ඡන්දහිමි නාම ලේඛන ඉ-සේවාව ලබා ගැනීම සඳහා අයදුම්පත**

1. අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ආයතනය කලාප අධ්‍යාපන කාර්යාලය/ පාඨශාලා :- ........................................................................................................

2. කාර්යාලයීය ලිපිනය :- ........................................................................................

........................................................................................................

........................................................................................................

2.1. දුරකථන අංක :- .......................................... **2.2.** ෆැක්ස් අංකය :- ..................................

3. කාර්යාලය අයත් ඡන්ද ප්‍රදේශය :- ........................................................................................................

4. කාර්යාලය අයත් දිස්ත්‍රික්කය :- ........................................................................................................

5. ඉ - තැපැල් ලිපිනය :- ........................................................................................................

6. ආයතනයේ තැපැල් ඡන්ද සහතික නිලධාරියාගේ විස්තර

**(I)** නම :- ........................................................................................................

**(II)** තනතුර :- ........................................................................................................

**(III)** ජාතික හැඳුනුම්පත් අංකය:- ..........................................

**(IV)** දුරකථන අංක

කාර්යාලය :- ................................................................

ජංගම :- ................................................................

ෆැක්ස් :- ................................................................

**(V)** ඉ - තැපැල් ලිපිනය :- ................................................................

ඉහත සඳහන් කළ තොරතුරු සත්‍ය බවත්, ලබාගන්නා ඡන්දහිමි නාමලේඛන තොරතුරු තැපැල් ඡන්ද අයදුම්පත්‍ර සම්පූර්ණ කිරීමේ කාරණය හැර වෙනත් කිසිදු කටයුත්තක් සඳහා භාවිතා නොකරන බවට (අවභාවිතා නොකරන බවට) සහතික කොට ප්‍රකාශ කරමි.

...................................... ........................................................................................................

දිනය ආයතන ප්‍රධානියාගේ අත්සන

නම හා නිල මුද්‍රව

---

මැතිවරණ කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා

අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)

ඉ - සේවාව හා මුර පදය ලබාදීම අනුමත කරමි.

...................................... ........................................................................

දිනය නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්

දිස්ත්‍රික්කය :- ..................................

PRE/2019/34/01/F1 ඇමුණුම II
(ආදර්ශය)

කාර්යාල ලිපිනය - ..........................................
..........................................
,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,
,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,,

දිනය - -20....../......./.....

තේරීම්භාර නිලධාරී,

.................................. මැතිවරණ කොට්ඨාසය

## ජනාධිපතිවරණය - 2019
## තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් පත් කිරීම

01. (අ) තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරියාගේ නම ..................................................................................

(ආ) ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

02. තනතුර - ........................................................................................................................................

03. (අ) සහතික කිරීමේ නිලධාරියාගේ කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කය - ..........................................................

(ආ) රාජකාරි ලිපිනය - ..............................................................................................................

(ඇ) රාජකාරි දුරකථන අංකය - ................................ (ඈ) ෆැක්ස් ................................ (ඉ) ඉ-තැපැල ...................

04. (අ) පෞද්ගලික ලිපිනය - ..............................................................................................................

05. (ආ) දුරකථන අංක (ජංගම) - ..............................................................................................................

නිලධාරියාගේ ආදර්ශන අත්සන - ..............................................................................................................

තැපැල් ඡන්ද අයදුම්පත්වල
තබන ලද නිල මුද්‍රාවේ ආදර්ශය
ඉදිරි කොටුව මත තබන්න

06. තැපැල් ඡන්ද සහතික කරන්නේ කුමන ආයතනයක/ කාර්යාලයක/ තැපැල් ඡන්ද දායකයන් සම්බන්ධයෙන් ද යන වග - ..............................................................................................................

07. තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරි වශයෙන් ඉහත නිලධාරී තැන දළ වශයෙන් කොතරම් තැපැල් ඡන්ද දායකයින් ප්‍රමාණයකට (සංඛ්‍යාවකට) අදාළව මෙම රාජකාරි ඉටු කරන්නේ ද යන වග -
..............................................................................................................

08. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය -

ඉහත විස්තර සඳහන් නිලධාරී තැන ........................................................................ ඡන්ද විමසීම වෙනුවෙන් තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරියෙකු වශයෙන් මෙයින් පත්කරමි. ඔහුට අදාළ රාජකාරි සම්බන්ධයෙන් ඔහු දැනුවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බවත් මෙයින් දන්වමි.

තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරී පත්කරනු ලබන නිලධාරියාගේ නම - ..........................................................

ජාතික හැඳුනුම්පත් අංකය - ....................................................

තනතුර - ....................................................

දුරකථන අංක - කාර්යාලය: ............................ ජංගම:...................... ෆැක්ස්:.........................

ඉ-තැපැල : ............................

අත්සන - ....................................................

නිල මුද්‍රව - ....................................................

(මෙම ආකෘතියේ සියලු විස්තර සම්පූර්ණ කළ යුතුය)

ඇමුණුම III

## ජනාධිපතිවරණය - 2019

## තැපැල් ඡන්ද ඉල්ලුම් කිරීම් පිළිබඳ තොරතුරු

| අනු අංකය | තැපැල් ඡන්දදායකයාගේ නම | තනතුර | රාජකාරි ලිපිනය | සහතික කිරීමේ නිලධාරී වෙත තැපැල් ඡන්ද අයදුම් පත්‍ර ඉදිරිපත් කළ දිනය | තැපැල් ඡන්ද ඉල්ලුම්පත් අදාල තේරීම්භාර නිලධාරී වෙත යවන ලද දිනය | තැපැල් ඡන්ද හිමියෙකු වශයෙන් ලියාපදිංචි වී ඇති පරිපාලන දිස්ත්‍රික්කය | අදාළ ඉල්ලුම්පත්‍රය අනුව තැපැල් ඡන්දදායකයා ලියාපදිංචි වී ඇති ඡන්ද ප්‍රදේශයේ අක්ෂරය හා අංකය, තම ඡන්ද කොට්ඨාශයේ අංකය හා නම ඡන්දදායකයාගේ අනුක්‍රමික අංකය | තේරීම්භාර නිලධාරී විසින් අයදුම්පත්‍ර පිළිගත් බව / ප්‍රතික්ෂේප කළ බව දන්වා ඇත්නම් ඒ තීරණ ලිපියේ විස්තර | තැපැල් ඡන්ද පත්‍රිකාව අඩංගු රක්ෂණ කවරය ලැබුන දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

ඇමුණුම IV

# තැපැල් ඡන්ද අයදුම්පත් ඉදිරිපත් කළ යුතු දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාල

| | ලිපිනය | | දුරකථන අංක | | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ෆැක්ස් අංකය |
|---|---|---|---|---|---|
| | | | දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | |
| 01 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | කොළඹ | 0112369134 | 011-2867472 | 011-2867471 |
| 02 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ගම්පහ | 0332222841 | 033-2222047 | 033-2222047 |
| 03 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | කළුතර | 0342222235 | 034-2222266 | 034-2222247 |
| 04 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | මහනුවර | 0812222233/35 | 081-2233187 | 081-2233190 |
| 05 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | මාතලේ | 0662222236 | 066-2222422 | 066-2222422 |
| 06 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | නුවරඑළිය | 0522222235 | 052-2222325 | 052-2222325 |
| 07 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ගාල්ල | 0912234235 | 091-2234028 | 091-2234018 |
| 08 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | මාතර | 0412222235 | 041-2222305 | 041-2222305 |
| 09 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | හම්බන්තොට | 0472256235 | 047-2256248 | 047-22256248 |
| 10 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | යාපනය | 0212222235 | 021-2222655 | 021-2228002 |
| 11 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | කිළිනොච්චිය | 0212283965 | 021-2285664 | 021-2285664 |
| 12 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | වවුනියාව | 0242222235 | 024-2222311 | 024-2222311 |
| 13 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | මන්නාරම | 0232222235 | 023-2222289 | 023-2222289 |
| 14 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | මුලතිව් | 0212290035 | 021-2061426 | 021-2061426 |
| 15 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | මඩකලපුව | 0652224435 | 065-2224312 | 065-2224374 |
| 16 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | අම්පාර | 0632222206 | 063-2224342 | 063-2222077 |
| 17 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ත්‍රිකුණාමලය | 0262222235 | 026-2222304 | 026-2222304 |
| 18 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | කුරුණෑගල | 0372222235 | 037-2221549 | 037-2222369 |
| 19 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | පුත්තලම | 0322265235 | 032-2265246 | 032-2265246 |
| 20 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | අනුරාධපුර | 0252235479 | 025-2222551 | 0252222551 |
| 21 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | පොළොන්නරුව | 0272222235 | 027-2222012 | 027-2222012 |
| 22 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | බදුල්ල | 0552222235 | 055-2222424 | 055-2222424 |
| 23 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | මොණරාගල | 0552276235 | 055-2276315 | 055-2276315 |
| 24 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | රත්නපුර | 0452222235 | 045-2222023 | 045-2222023 |
| 25 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | කෑගල්ල | 0352222235 | 035-2222561 | 035-2222561 |